

## 10

# අත් තස්කියා



## තස්කියා යනු කුමක් ද?

තස්කියා යන අරාබි පදයෙහි පාරිශුද්ධ කිරීම, පිළිවෙළට සකස් කිරීම යන අර්ථ ගම්‍ය වේ. ඉස්ලාමීය භාෂා ව්‍යවහාරයේ දී චිත්ත පාරිශුද්ධිය යන අර්ථය ගම්‍ය වන පරිදි "තස්කියතුන් නෆ්ස්" යන්න කෙටියෙන් "තස්කියා" ලෙස හැඳින්වේ. තස්කියා තුළින්, මුස්ලිම්වරයකු අල්ලාහ්ට ආදේශ කිරීමෙහි ලා අන්තර්ගත වන සියලු ම දුර්ගුණාංගවලින් ද තම සිතත් ක්‍රියාවත් ආරක්ෂා කරගෙන අල්ලාහ් ප්‍රිය නොකරන සියලු ම ක්‍රියාකාරකම්, ආශාවන්, චින්තනයන් යනාදියෙන් සිත දමනය කොට එහි යහ ගුණාංග වර්ධනය කර පරිශුද්ධ ව තබා ගත යුතු ය.

සිතෙහි (නෆ්ස්) තත්ත්වයන් තුනක් පිළිබඳ ව අල් කුර්ආනයෙහි සඳහන් කර ඇත.

1. 'නෆ්සුල් අම්මාරා බිස්සූඃ' යන අයහපතට පොළඹවන සිත. මෙය යහපත උදෙසා උත්සුක නොකරයි. හැඟීම්වලට හා ෂෛතාන්ට වහල් වූ තත්ත්වයක් දක්නට ලැබේ.

2. 'නෆ්සුල් ලව්වාමා' යන තමාව රිදවා ගන්නා සිත. මෙහි හැඟීම්වලට විරුද්ධ ව සටනක් තිබේ. එසේ ම, හැඟීම් උත්සන්න වී අකුසලෙහි නියැළුණේ නම්, එම මොහොතේ ඒ වෙනුවෙන් සිතින් පසුතැවිලි වේ. තමාට ම දෙස් පවරා ගනීයි. තම තත්ත්වය වටහා ගෙන ශෝකයට පත් වේ.

3. 'නෆ්සුල් මුත්මඉන්නා' යන තෘප්තිමත් සිත. එය කලබලයෙන් හා නොසන්සුන් බවින් තොර තැන්පත් තත්ත්වයෙහි දක්නට ලැබේ. මෙහි අයහපතට පොළඹවීම අඩු ය. යහපත කෙරෙහි ඇති පොළඹවීම් අධික වශයෙන් දක්නට ලැබේ. මෙම තෙවන තත්ත්වය තුළ අයහපතින් ආරක්ෂා කරන ලද සිතක් ගොඩ නගා ගැනීම "තස්කියා" මගින් බලාපොරොත්තු වේ.

## තස්කියාවෙහි වැදගත්කම.

මිනිසාට දෙලොව ම ජය ගැනීමට චිත්ත පාරිශුද්ධිය අත්‍යවශ්‍ය කරුණකි. පාපී ක්‍රියාවන්ගෙන් සිත ආරක්ෂාකර ගැනීම තුළින් මෙලොව, පරලොව ජය අත් කර ගත හැකි බව අල් කුර්ආනය පවසයි.

නියත වශයෙන් ම කවරකු එය (සිත) පිරිසිදු කර ගන්නේ ද ඔහු ජය අත් කර ගත්තේ ය. තව ද කවරකු එය දූෂණය කර ගත්තේ ද ඔහු පරාජයට පත් වූයේ ය. (91:9-10)

මේ පිළිබඳ ව අල්ලාහ් තම මැවීම් වන හිරු, සඳු, රාත්‍රිය, දහවල යනාදිය මත දිවුරා පවසා තිබීමෙන් චිත්ත පාරිශුද්ධියෙහි වැදගත්කම වඩවඩාත් ස්ථිර කරන්නේ ය.

දේව ධර්ම දූතයන් මෙලොවට එවන ලද ප්‍රධාන අරමුණු අතරින් එකක් ලෙස චිත්ත පාරිශුද්ධිය දක්විය හැකි ය. නබි (සල්) තුමාගේ සේවය පිළිබඳ ව සඳහන් කරන විට අල්ලාහ් තම දේව ග්‍රන්ථයෙහි මෙසේ පවසන්නේ ය.

ලිවීමට, කියවීමට නොහැක්කන් අතුරින් ඔහු (අල්ලාහ්) දේව ධර්ම දූතයන්ව එව්වේ ය. එම රසූල්වරයා ඔවුනට අල්ලාහ්ගේ දේව වැකි පාරායනය කර පෙන්වන්නා ලෙස ද ඔවුන් පාරිශුද්ධ කරවන්නා ලෙස ද ඔවුන්ට ධර්මය හා ඥානය (සුන්නාහ්ව) උගන්වා දෙන්නා ලෙස ද සිටින්නේ ය. (62:02)

ස්වර්ගයට පිවිසිය හැකි මූලික සුදුසුකමක් ලෙස සිත පාරිශුද්ධ කරවන ක්‍රියාකාරකම් දක්විය හැකි ය. මෙය ප්‍රවේසමින් මෙහෙයවිය යුතු ය. එය නිවැරදි මාර්ගයේ යොමු කරවූයේ නම්, පමණක් ස්වර්ගයට යන මාර්ගයේ ගමන් කළ හැකි ය. මෙය පහත සඳහන් අල් කුර්ආන් වැකියෙහි පැහැදිලි කර ඇත.

කවරකු, ''තම දෙවියන් ඉදිරියේ සිටී'' යැයි බිය බැති ව, තම සිත ඉච්ඡාවෙන් වළක්වා ගන්නේ ද නියත වශයෙන් ඔහුගේ නවාතැන ස්වර්ගය වේ. (80:40-41)

නබි (සල්) තුමාණෝ චිත්ත පාරිශුද්ධියේ වැදගත්කම පිළිබඳ ව අවස්ථා රැසක දී ම තම සගයන්ට ගෙන හැර දක්වූහ. කෙනකුගේ සිත යහපත් වීමෙහි වැදගත්කම පිළිබඳ ව වරක් නබි (සල්) තුමාණෝ පහත ආකාරයෙන් වටහා දුන්හ.

නියත වශයෙන් ම ශරීරයෙහි එක මස් පිඬක් ඇත. එය අයහපත් වූයේ නම්, මුළු ශරීරය ම අයහපත් වේ. එය යහපත් වූයේ නම්, මුළු ශරීරය ම යහපත් වේ. එය සිත වේ (බුහාරි, මුස්ලිම්)

ඉස්ලාමය තුළ ජිහාද් අතුරින් ඉතාම යහපත් ජිහාදය ලෙස "මුජාහදතුන් නෆ්ස්" නම් වූ සිතින් කරන ජිහාදය සලකනු ලැබේ. මෙය මෙම හදීසය මගින් පැහැදිලි කරයි. (මල්ලව පොර යුද්ධයේ දී) අනෙකා බිම හෙලන්නා වීරයකු නොවේ. කෝපයක දී තම සිත දමනය කර ගනු ලබන්නා සත්‍යය වීරයකු වේ.

නබි (සල්) තුමාණෝ විටින් විට චිත්ත පාරිශුද්ධිය පතා අල්ලාහ්ගෙන් ද ප්‍රර්ථනා කළහ.

اللَّهُمَّ آتِ نُفُوسَنَا تَقْوَاهَا، وَزَكِّهَا أَنْتَ خَيْرُ مَنْ زَكَّاهَا، أَنْتَ وَلِيُّهَا وَمَوْلاَهَا

"යා අල්ලාහ් ! අපගේ සිත්හි දේව බිය ඇති කරත්වා! ඔබ එය පාරිශුද්ධ කරත්වා! නියත වශයෙන්ම ශ්‍රේෂ්ඨත ම පාරිශුද්ධ කරන්නා ඔබ ම ය. එහි වගකීම දරන්නා ලෙස හා ස්වාමියා ලෙස සිටින්නේ ඔබ ය. (මුස්ලිම්)

පෙර හා පසු පාපයන් කමා කරනු ලැබූ මුහම්මද් (සල්) තුමා චිත්ත පාරිශුද්ධිය උදෙසා මෙතරම් දෙවියන් අයැදුයේ නම්, අප එහි අවශ්‍යතාව කෙතරම් ඇත්තවුන් ද? යන්න කල්පනා කළ යුතු ය.

අපගේ ක්‍රියාකාරකම් කොතරම් විශාල වුවත් චිත්ත පාරිශුද්ධිය සමග එය ඉටු නොකරන විට ඒවාට අල්ලාහ් ඉදිරියේ කිසි දු ප්‍රයෝජනයක් හා වටිනාකමක් නොමැත. අල්ලාහ් අපගේ සියලු ක්‍රියාකාරකම්වල දී අපගේ සිත පිළිබඳ අවධානය යොමු කරන්නේ ය. අල්ලාහ් ඉදිරියේ දී අපගේ බාහිර පෙනුමට වඩා සිතට වැඩි වැදගත්කමක් හිමි වන්නේ ය. අබූ හුරෛරා (රළි) තුමා නිවේදනය කරන ලද, "නියත වශයෙන් ම අල්ලාහ් ඔබලාගේ ශරීරය හෝ මුහුණ හෝ නොබලන්නේ ය. නමුදු ඔබලාගේ සිත් බලන්නේ ය" (මුස්ලිම්) යන හදීසය තුළින් මෙය අපට හොඳින් පැහැදිලි කරන්නේ ය.

එම නිසා, අල් කුර්ආනය හා හදීස් අපට පෙන්වා දෙන මගපෙන්වීම් පිළිපැද ආටෝප්පය, ආඩම්භරකම, ඊර්ෂ්‍යාව, වැනි පහත් ගුණාංගවලින් වැළකීම, ෆර්ලු වන වගකීම් නියමිත ආකාරයෙන් ඉටු කිරීම, සුන්නත් වන වතාවත් ඉටු කිරීම, දික්ර්හි නියැළීම, අල් කුර්ආනය වැඩි වශයෙන් පාරායනය කිරීම, තව්බා කිරීම යනාදී විවිධ ක්‍රියාකාරකම් තුළින් අපගේ සිත් පාරිශුද්ධ කරගෙන දෙලොවෙහි ම ජය අත් කරගැනීමට උත්සාහ කරමු.

**අභ්‍යාසය**

01. "තස්කියා" යන්නෙහි භාෂාමය අර්ථය කුමක් ද?

02. ඉස්ලාමීය ව්‍යවහාරයේ දී "තස්කියතුන් නෆ්ස්" යන්නෙන් කුමක් අදහස් කරන්නේ ද ?

03. "තස්කියා" සඳහා අල් කුර්ආනය හා හදීස් සාධක එක බැගින් සොයා ලියන්න.

04. අල් කුර්ආනය මිනිසාගේ සිත බෙදා දක්වා ඇත්තේ කෙසේ ද?

05. තස්කියාවෙහි වැදගත්කම පිළිබඳ ව කරුණු පහක් ලියන්න.

06. අප තුළ චිත්ත පාරිශුද්ධිය ඇති කරලීම උදෙසා අප විසින් පිළිපැදිය යුතු කරුණු පහක් ලියා පෙන්වන්න.